**කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සඳහා අතිරේක මූල්‍යනය සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - 2021**

---

**කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සඳහා අතිරේක මූල්‍යනය සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතියේ 2020 ජූලි 23 දින සිට 2021 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 25 දිනැති භාර අරමුදලින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය කරන මූල්‍ය ප්‍රදාන සඳහා වූ ස්ථාවර කොන්දේසි 2.07 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් හා කාලසීමාව**

---

**ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සඳහා අතිරේක මූල්‍යනය සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ තර්ජනය වැළැක්වීම, හඳුනාගැනීම සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍යය සූදානම සඳහා ජාතික පද්ධති ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 411.45කට සමාන එ.ජ.ඩො මිලියන 1.72 ක් වූ අතර එය ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මූල්‍යයනය කිරීම සඳහා එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2020 ජූලි 23 දින ආරම්භ කර තිබුණු අතර 2021 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.**

**1.3 මතය**

---

**ව්‍යාපෘතියේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

2.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) 2002 අංක 14 දරන එකතු කළ අගය බදු පනතේ 20(1) වගන්තිය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 ජුලි 09 දිනැති සීජීආර්අයි/2019/03/01 (ins & cir) දරන ලිපිය | විධිමත් බදු ඉන්වොයිස්පත් නොමැතිව අවස්ථාව 20 කදී එකතු කළ අගය බදු එකතුව රු.මිලියන 3.7 ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් වෙත ගෙවන ලද එකතු කළ අගය බදු පිළිබඳ විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර අදාළ ආයතනය හෝ පුද්ගලයා ක්‍රියාකාරී බදු ගෙවන්නෙකු බව තහවුරු කර ගැනීමකින් තොරව ව්‍යාපෘතිය එකතු කළ අගය බදු ලෙස රු.549,824ක් ගෙවා තිබුණි. | ලියාපදිංචි VAT අංකයට සහ බදු ඉන්වොයිස්පත් සමග VAT ගෙවීම සඳහා සැපයුම්කරු ඉල්ලා තිබුණු බැවින් මෙය ගෙවන ලදී. හැකි ඉක්මනින් බදු වාර්තා යැවීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව එකතු කළ අගය බදු ගෙවිය යුතු අතර බදු වාර්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. |

3. භෞතික කාර්යසාධනය

-----------------------

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ නේවාසික ගොඩනැගිල්ලේ බිම්මහලේ අලුත්වැඩියා කටයුතුවලදී රු.233,346 වටිනා වැඩ අයිතම් දෙකක් අවශ්‍යා ප්‍රමිතියට ඉදිකර නොතිබුණි. මෙම ප්‍රසම්පාදන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.12(අ), 2.11.2, 3.4.2(අ), 5.4.8(අ), 5.3.5(ආ), 8.9.1 සහ 8.12.2 සමඟ අනුකූලවී නොතිබුණි. තවද, රු.426,724 ක් වටිනා අතිරේක වැඩ අයිතම් 20 ක මිල විශ්ලේෂණයන් මෙම කොන්ත්‍රාත්තුවට අදාළ තාක්ෂණික දැනුමක් සහිත වගකිවයුතු නිලධාරියෙකු විසින් නිර්දේශ කර හෝ අනුමත කර නොතිබුණි. | අනාගතයේ මෙවැනි මග හැරීම් සහ අඩුපාඩු වළක්වා ගැනීමේ අරමුණින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.12(අ), 2.11.2, 3.4.2(අ), 5.4.8(අ), 5.3.5(ආ), 8.9.1, 8.9.1(අ),8.12.2 දැඩිව අනුගමනය කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සමඟ අනුකූල වීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුල්ලේරියාව හෙද පාසලේ මුළුතැන්ගෙය සහ කෑම කාමරය නවීකරණය සඳහා වන කොන්ත්‍රාත්තුවට අදාළ රු.493,399 ක් වටිනා අතිරේක වැඩ අයිතම් 07 ක මිල විශ්ලේෂණයන් තාක්ෂණික දැනුමක් සහිත වගකිව යුතු නිලධාරියෙකු විසින් නිර්දේශකර හෝ අනුමත කර නොතිබුණි. 2022 ජනවාරි 06 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී රු.212,244 ක වැඩිපුර ගෙවීමක් කර ඇති බව නිරීක්ෂණය විය. | මිල විශ්ලේෂණ නිර්දේශ කිරීමට සහ අනුමත කිරීමට පියවර ගනු ලැබේ. | වගකිවයුතු නිලධාරීයකුගෙන් නිර්දේශ ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ වසංගත රෝග විද්‍යා අංශය මගින් මුළු පිරිවැය රු.මිලියන 18 කට ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන කටයුතු 03 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.12(අ), 5.4.8(අ), 5.3.5(ආ), 8.9.1 සහ 8.12.2 සමඟ අනුකූලවී නොතිබුණි. තවද, රු.මිලියන 2.1ක් වටිනා අතිරේක වැඩ අයිතම් 36 ක මිල විශ්ලේෂණයන් තාක්ෂණික දැනුමක් සහිත වගකිව යුතු නිලධාරියෙකු විසින් නිර්දේශ කර හෝ අනුමත කර නොතිබුණි. | අනාගතයේ මෙවැනි මඟහැරීම් සහ අඩුපාඩු වළක්වා ගැනීමේ අරමුණින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.1.2(අ), 2.11.2, 3.4.2(අ), 5.4.8(අ), 5.3.5(ආ), 8.9.1, 8.9.1(අ), 8.12.2 දැඩිව අනුගමනය කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සමඟ අනුකූල වීමට පියවර ගත යුතු අතර වගකිව යුතු නිලධාරියෙකුගෙන් නිර්දේශ ලබා ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 පද්ධති හා පාලනයන්

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී අවස්ථා 68කදී රු.මිලියන 89 කට මිලදීගත් සෞඛ්‍ය උපකරණ, යන්ත්‍ර සහ උපකරණ සහ ලී බඩු රෝහල් සහ සෞඛ්‍ය ආයතන වෙත නිකුත් කළ බවට හෝ ලැබුණු බවට භාණ්ඩ නිකුත් කිරීමේ තුණ්ඩු සහ භාණ්ඩ ලැබීම් තුණ්ඩු වැනි ලිඛිත ලියවිලි නොතිබුණි. තවද, එම වත්කම් ව්‍යාපෘතිය අවසානයේදී විධිමත්ව මාරු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අවසානයේදී වත්කම් විධිමත්ව මාරුකිරීමට පියවර ගනු ලැබේ. | මෙම වත්කම් නියමිත පරිදි මාරු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතිය විසින් පිරිවැය රු.මිලියන 71.2 කට මිලදීගත් උපකරණ සහ රු.මිලියන 34.3 පිරිවැයකට ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ව්‍යාපෘතියේ CIGAS වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මිලදීගත් උපකරණ සහ ඉදිකිරීම් කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. ව්‍යාපෘතියේ CIGAS පද්ධති ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම්වල වටිනාකම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |